# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2024
2026 ජූලි / අගෝස්තු

මානවශාස්ත්‍ර පීඨය

## බෞද්ධ මනෝවිද්‍යාව

**බෞද්ධ මනෝවිද්‍යාව හැඳින්වීම හා භාරතීය මනෝවිද්‍යාවෙහි දාර්ශනික පසුබිම BUPS – 18214**

යටත් පිරිසෙයින් එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින්වත් ඇතුළත් වන සේ ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

### I කොටස

01. විෂය පථය සහ ප්‍රධාන ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කරමින් බෞද්ධ මනෝවිද්‍යාවෙහි ස්වභාවය හා වැදගත්කම පැහැදිලි කරන්න.

02. චිත්ත, මන සහ විඤ්ඤාණ යන පද පහදා දෙමින් බෞද්ධ මනෝවිශ්ලේෂණයෙහි ස්වභාවය ගෙනහැර දක්වන්න.

03. බෞද්ධ විග්‍රහය තුළින් ප්‍රකට කෙරෙන මනෝරෝග වර්ගීකරණය කොට ඉන් ප්‍රධාන මනෝරෝග දෙකක් (02) විස්තර කරන්න.

04. සංජානනය (Perception) යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වා, ඉන්ද්‍රිය සංජානන ක්‍රියාවලිය හරහා පුද්ගල චර්යා ගොඩනැගෙන ආකාරය බෞද්ධ මනෝවිද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙන් අධ්‍යයනය කරන්න.

05. බෞද්ධ ඉගැන්වීම් තුළින් විද්‍යමාන වන මනෝරෝග ප්‍රතිකාර ක්‍රම පිළිබඳ ප්‍රමාණවත් විවරණයක් කරන්න.

### II කොටස

06. භාරතීය දර්ශනයේ ඓතිහාසික විකාශය හා සංවර්ධනය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

07. යෝග දර්ශනයෙහි අන්තර්ගත මනෝවිද්‍යාත්මක වැදගත්කම පිළිබඳ "අෂ්ටාංග යෝග" ඇසුරින් විමර්ශනය කරන්න.

08. ජෛන ආගමෙහි සඳහන් අවිහිංසාවාදය සහ අනේකාන්තවාදය යන ඉගැන්වීම්වල අන්තර්ගත මනෝවිද්‍යාත්මක අගය පෙන්වා දෙන්න.

09. "උපනිෂද්" යන්නෙහි අර්ථය පැහැදිලි කොට, මෝක්ෂ සාධනය උදෙසා උපනිෂද් මගින් අවධාරිත සදාචාරාත්මක පිළිවෙත් ගෙනහැර දක්වන්න.

10. පහත සඳහන් මාතෘකා අතුරින් දෙකකට (02) ප්‍රමාණවත් සටහන් සපයන්න.
    i. ප්‍රත්‍යක්ෂය
    ii. අනුමානය
    iii. පූර්ව මීමාංසා
    iv. ආත්මන්

******************************